**ඉඩම් මැනුම් සභාව - 2020**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ඉඩම් මැනුම් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව ආයෝජන ක්‍රියාකාරකම් තුළ ස්ථාවර තැන්පතු ලෙස රු.1,789,992 ක් පෙන්වා තිබුණද, එකී ආයෝජන සම්බන්ධයෙන් බැංකුව විසින් ලබා දී තිබුණු බැංකු සනාථන ලිපිවලට අනුව එම ශේෂය රු. 1,538,872 ක් විය. ඒ අනුව රු. 251,120 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය. | ස්ථාවර තැන්පතු ශේෂය 2019 දෙසැම්බර් 31 දිනට රු. 9,362,816.48 ක් හා 2020 දෙසැම්බර් 31 දිනට රු.11,152,808.93 ක් වේ. ඒ අනුව වෙනස රු.1,789,992 ක් වන අතර, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇත.<br>* 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන ලෙස බැංකුව මගින් තහවුරු කර එවන ලද බැංකු ප්‍රකාශය හා සැසඳේ. | පවතින වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| මිනින්දෝරු බලපත්‍ර අලුත් කිරීම. | 4,782,200 | සෘජුවම බැංකුවට බැර කර තිබුණු මෙම මුදල් අවශ්‍ය සැසඳීම් කර ආදායමට ගැනීමට කටයුතු නොකර ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු අතර, ඊට | සෘජුව ප්‍රේෂණය කරන ගාස්තු තහවුරු කර ගැනීමෙන් අනතුරුව බලපත්‍ර නිකුත් කරන අතර, නිකුත් කරනු ලබන දිනය මත පදනම්ව මාසිකව හඳුනාගන්නා තෙක් අත්තිකාරම් ගිණුමේ රඳවා ගනී. 2021 බලපත්‍ර නිකුත් | අදාළ ගනුදෙනු තහවුරු කරගැනීම සඳහා පවතින මූලාශ්‍ර හා උපලේඛන විගණන කටයුතු සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අදාළ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කිරීමේ හා 2021 මාර්තු 31 දිනට ගැසට් කිරීමේ කටයුතු සිදුවන බැවින් මූලාශ්‍ර ලේඛන විගණනයට භාර දීමට නොහැකිවිය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2002 අංක 17 දරන මැනුම් පනත | | | |
| (1) 38 (ඇ) වගන්තිය | 2019 ජනවාරි 03දිනැති 239 වෙනි සභා රැස්වීමේදී තීරණය කර තිබුණ පරිදි අවශ්‍ය කාර්ය පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද කළමනාකරණ සහකාර පත්වීම් දෙක ලබා ගැනීමට අදාළ කාර්ය පරිපාටිය සකස් කර 2021 අප්‍රේල් 08 දින තෙවන වරට ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇත. අදාළ නිර්දේශය ලැබුණු පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නියමිත ක්‍රමවේදයට අවශ්‍ය විභාගයන් පවත්වා බඳවා ගැනිමට කටයුතු කරමි. එතෙක් ඉඩම් මැනුම් සභාවේ රැස්වීම්වලදී අනුමත කරන ලද පරිදි කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරිනියන්ගෙන් රාජකාරි ආවරණය කර ගැනිමට කටයුතු කරමි. | සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (2) 38 (ඊ) වගන්තිය | සභාවට අවශ්‍ය කරන පරිදි කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබුණ ද ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම සඳහා සභාවට තිබුණු බලතල අනුව 2020 මැයි 22 දිනැති අංක 226 දරන හා 2020 | දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කර ගැනීමට, 2020 දෙසැම්බර් 23 දිනැති 278 දරන මාසික රැස්වීමේදී ගත් තීරණය මත සර්වේයර් ජනරාල් වෙත ඉල්ලීම් කර ඇති නමුත්, භූමිය සභාවට අයත් නොවන නිසා සභාවේ මුදල් භාවිතා කිරීම පිළිබඳ ගැටළුවක් පවතී. රක්ෂණාවරණය සඳහා අනුමැතිය දුන්නද අර්ධ රාජ්‍ය ආයතන නිලධාරීන් රක්ෂණය | යෝජිත සුබසාධන හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ඉඩම් මැනුම් සභාවේ අනුමැතිය ලබාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 23 දිනැති අංක 278 දරන රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබීම විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය. | නොකරන බව NITF ආයතනය පවසා ඇති බැවින් වෙනත් ආයතනයක රක්ෂණාවරණයකට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීමට 2021 මැයි 07 දිනැති 285 වැනි රැස්වීමේදී තීරණය කරන ලදි. | |
| (3) 43 (1) වගන්තිය | (i) සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ එදිනට පෙර සභාව විසින් සියලු ලියාපදිංචි බලපත්‍ර ලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු වුවත්, 2020 වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු 1320 දෙනෙකුගෙන් 2020ජූනි 26 දිනැති අංක 2182 දරන ගැසට් පත්‍රයේ පළ කර තිබුණේ 925 දෙනෙකුගේ නම් පමණක් විය . | ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ නාමලේඛනය ගැසට් කිරීම සඳහා 2020 පෙබරවාරි 28 දින යවන විට බලපත්‍ර නිකුත් කරන ලද මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 925 ක් විය. 2020 දෙසැම්බර් 31 වන විට 2020 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 1320 ක් නිකුත් කර ඇත. සම්පූර්ණ නාම ලේඛනයwww.landsurveycouncil.org වෙබ් අඩවියේද පළකර ඇත. සෑම වර්ෂයකම අනුගමනය කරන ලද ක්‍රමවේදය මෙය වන අතර, ගැසට් පත්‍රයේ පළ කළ පසුව නිකුත් කරන වාර්ෂික මැනුම් බලපත්‍ර ලාභීන්ගේ නම් සඳහා වෙබ් අඩවිය බලන ලෙස ගැසට් පත්‍රයේ සටහනක් යොදා ඇත. | සියලුම බලපත්‍රලාභී මිනින්දෝරුවරුන් ගේ නාම ලේඛන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ යුතුය. |
| | (ii) වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ දින සිට එක් මාසයක් ඇතුළත ඒ පිළිබඳව දැනුම් දෙමින් ගැසට් පත්‍රයෙහි නිවේදනයක් නිකුත් කළ යුතු වුවද, 2020 වර්ෂයේ බලපත්‍රය අත්හිටුවන ලද එක්මිනින්දෝරුවරයෙකු සිටින අතර, අත්හිටුවීමේ දින සිට එක් මාසයක් ඇතුළත ඒ පිළිබඳව දැනුම් දෙමින් ගැසට් පත්‍රයක් පළ කර නොතිබුණි. | 2020 වාර්ෂික බලපත්‍රය අත්හිටුවීමකදී හෝ අවලංගු කිරීමකදී ගැසට් පත්‍රයේ පළ කිරීමට මේ වන විට අවශ්‍ය පියවර ගෙන අදාළ විෂය නිලධාරිනියගේ සේවා විභජණ පත්‍රයටද ඇතුළත් කර අතපසුවීමක් නොවන ලෙසට අධීක්ෂණය කිරීමට කටයුතු කරමි. | බලපත්‍ර අවලංගු කිරීම් හෝ අත්හිටුවීම් පනත ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. |
| (ආ)<br>(i) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ | පනත ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කර ඒ බව ප්‍රකාශයට පත්කර | සභාවේ තොරතුරු නිලධාරී ලෙස ලේකම් වරයා කටයුතු කරන අතර, | තොරතුරු නිලධාරියකු පත්කර |

| | | | |
|---|---|---|---|
| අයිතිවාසිකම් පිළිබඳ පනත | නොතිබුණි. | එය අනීතික නම් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ඒ බව ප්‍රකාශයට පත් කළ යුතුය. |
| (ii) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 41 වැනි වගන්තිය යටතේ සාදන ලද නියෝග මාලාවෙහි අංක 07 නියෝගය | මෙම නියෝගය අනුව තොරතුරු ඉල්ලීමක් සපුරාලීමට තීරණය කළ වහාම ඒ බව වැඩ කරන දින 14 ක් ඇතුළත අදාළ ආකෘතිය ප්‍රකාරව තොරතුරු නිලධාරියා විසින් අයදුම්කරුට ලිඛිතව දන්වා යැවිය යුතු වුවත් , අවස්ථා හයකදී කරන ලද ඉල්ලීම්වලට අදාළව එසේ දන්වා යැවීම සඳහා දින 14ත්18 1 ත් අතර කාලයක් ගතකර තිබුණි. | සභාවට තොරතුරු දැනගැනිම සඳහා ඉල්ලීමක් ලැබුණ විට එය භාරගත් බව අයදුම්කරුට දන්වන අතර, ලේකම්වරයා විසින් සකස්කරන පිළිතුර අයදුම්කරුට යැවිමට පෙර සභාවේ කමිටු අනුමැතිය ගත යුතුය. යම් දෝෂයක් තිබේනම් ඊළඟ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර අනුමැතිය ගෙන පිළිතුර යැවීමට කටයුතු කරනු ලැබේ.<br>යම් ප්‍රමාදයක් මෙම ක්‍රියාවලිය තුළ සිදුවන බව සභාවටද වැටහී ඇති බැවින් මෙම ප්‍රමාදයන් වළක්වා ගැනිමට වෙනත් ක්‍රමවේදයන් අනුගමනය කිරීම කෙරෙහි අවධානය මේ වන විට යොමු වී ඇත. | ඉල්ලා සිටින තොරතුරක් පනත ප්‍රකාරව දින 14 ක් ඇතුළත අයදුම්කරු වෙත ලබාදීම සඳහා බලය පවරන ලද තොරතුරු නිලධාරියකු පත්කර එම නිලධාරියාගේ නම, දුරකථන අංකය ප්‍රසිද්ධ කළ යුතුය. |
| (ඇ) 2018 මාර්තු 26 දිනැති 221 වෙනි සභා රැස්වීම් තීරණය | සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදුකරන සුදුසුකම් නොලත් පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීමට පොලිස්පතිවරයා දැනුවත් කිරීමට තීරණය කර තිබුණද එසේ පොලිස්පතිවරයා දැනුවත් කර නොතිබුණි. | මෙය 2018 සිදුවීමකි. කාර්යමණ්ඩලයේ නිලධාරීන් නිබඳව මාරුවන අතර, අඩක් කොන්ත්‍රාත් හා තාවකාලික පදනමට වැඩ කරන බැවින් සභාවේ කටයුතුද අවිච්ඡින්නව පවත්වා ගැනිම දුෂ්කර වී ඇත. පුවත් පත් මගින් මහජනතාවට දන්වා ඇති බැවින් පොලිස්පති තුමාද දැනුවත්ව ඇතැයි උපකල්පනය කරමි. පොලිස්පති වෙතට දන්වා යවා නොමැති බවට අනාවරණය වුවහොත් සභාවේ කමිටු තීරණයක් ගෙන යථාවත් කරන බව කරුණාවෙන් දන්වමි. | මැනුම් කටයුතු කරන සුදුසුකම් නොලත් සහ ලියාපදිංචි නොවූ පුද්ගලයින් එයින් වළක්වාලීම සඳහා නිසි පියවර ගත යුතුය. |

**1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 අංක 24 දරන දේශිය ආදායම් (සංශෝධිත) පනතේ 9 (1) වගන්තියේ තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි ඉඩම් මැනුම් සභාව බදු ගෙවීමෙන් නිදහස් ආයතනයක් ලෙස සඳහන් කර නොතිබුණු අතර, එවැනි නිදහස් කිරීමකට | සභාව 2002 අංක 17 දරන මැනුම් පනතින් අර්ථ දැක්වෙන පරිදි මිනින්දෝරු වෘත්තියේ ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වාගෙන යෑම සහ ඉඩම් මැනුම් කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තිමය විනය පවත්වාගෙන යෑම වෙනුවෙන් පිහිටුවා ඇති ලාභ ඉපයීමේ අරමුණින් තොර | බදු ගෙවීමෙන් නිදහස් වන්නේ නම් ඊට අදාළ අනුමැතීන් ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| අදාළ ලියවිලිද නොතිබුණු නමුත්, සභාව විසින් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආයතනයකි. ආරම්භයේදී පමණක් රජයේ අරමුදල් ලබාගත් නමුත් මේවන විට සභාවේ කටයුතු මිනින්දෝරුවරුන්ගෙන් එකතු කරගන්නා අරමුදල්වලින් සිදුකරන රාජ්‍ය ආයතනයකි. එබැවින් සභාව ස්ථාපිත කර ඇති දින සිට මේ දක්වා ආදායම් බදු ගෙවීමක් කර නොමැත. | |
| (ආ) 2006 අංක 06 දරන මුද්දර බදු (සංශෝධිත) පනතේ (7) වගන්තිය | | |
| (1) 2019 දෙසැම්බර් 31,2020 ජුනි 30, 2020සැප්තැම්බර් 30 හා 2020දෙසැම්බර් 31 න් අවසන් කාර්තුවල සමතයකට පත් කරන ලද මුද්දර ගාස්තු ප්‍රකාශන කාර්තුව අවසන් වී එළඹෙන මස දින 15ක් තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළයුතු වුවත්, 2019 දෙසැම්බර් 31න් අවසන් ප්‍රකාශය 2020පෙබරවාරි 03 දින ප්‍රමාද වී ඉදිරිපත් කර ඇති අතර, 2020 ජුනි 30 න් 2020 සැප්තැම්බර් 30 න් හා 2020 දෙසැම්බර් 31න් අවසන් කාර්තුවල ප්‍රකාශන 2021 අප්‍රේල් මස වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී තොරතුරු පරීක්ෂා කර පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. | නියමිත කාල සීමාවන් තුළ අය කළ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. |
| (2) සියලුම කාර්තුවල මුද්දර බද්ද අදාළ කාර්තුව අවසන් වූ දින සිට දින 15ක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවත්, 2019 වර්ෂයේ අවසන් කාර්තුව හා සමාලෝචිත වර්ෂයේ සියලුම කාර්තු සඳහා වූ මුද්දර බදු ප්‍රමාද වී ප්‍රේෂණය කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු මුද්දර බදු ලෙස පෙන්නුම් කර තිබුණේ රු.21,075 ක් වුවද, 2021 පෙබරවාරි 19 දින ප්‍රේෂණය කර තිබුණේ රු. 2,475 ක් | ඉදිරියේදී තොරතුරු පරීක්ෂා කර පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. | පනත අනුව නියමිත කාලය තුළ ගෙවීම් කළ යුතුය. |

පමණක් වූ අතර, 2020 දෙසැම්බර් මස දක්වා වූ මුද්දර බදු වගකීමක් වන නොගෙවා ඉතිරිව ඇති මුද්දර බදු ප්‍රමාණය වූ රු. 18,600 ක මුදල 2021 ජනවාරි 15හෝ එදිනට පෙර ගෙවිය යුතු වුවත් එසේ ගෙවා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,868,355 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,188,879 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,679,476 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට බලපත්‍ර ගාස්තු, ලියාපදිංචි ගාස්තු, ස්ථාවර තැන්පතු පොලී ආදායම් සහ අනෙකුත් ආදායම් ආදිය රු. 3,529,882 කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

නව ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම හා පෙර වර්ෂවල ස්ථාවර තැන්පතුවල මූලික ආයෝජන වටිනාකම් වැඩිවීම හේතුවෙන් ස්ථාවර තැන්පතුවල පොලී ආදායම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 93 කින් ඉහළ ගොස් තිබුණි. සුහුරු බලපත්‍ර ශුද්ධ ආදායම හා අත්තිකාරම් ආදායම් යන නව ආදායම් මාර්ග හේතුවෙන් අනෙකුත් ආදායම් පෙර වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී සියයට 632 කින් වර්ධනය වී තිබුණු අතර, වැඩමුලු ආදායම පෙර වර්ෂයට වඩා අඩුවීම හේතුවෙන් වැඩමුලු ශුද්ධ ආදායම සියයට 55 කින් පහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් 1 : 0.5 ක් හා 1 : 0.4 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතය පහළ මට්ටමක් ගැනීමට හේතු වී තිබුණේ මිනින්දෝරු දිනය සඳහා එකතු කරන ලද මුදල් යන නව වගකීමක් සමාලෝචිත වර්ෂයේ පැවතීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2012 ජුලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් නියෝගය අනුව සභාව සඳහා ලේකම්වරයෙකු පත් කළ යුතු වුවත් පුරප්පාඩුව පවතින ලේකම් තනතුර | දීප ව්‍යාප්ත සේවාවක පළමු පංතියේ තනතුරක් විය යුතු බවට සලකා අංක 277 දරන කමිටු රැස්වීමේදී සභා සම්මත වුවද, ඒ සඳහා අනුමත MM-1-1 වැටුප් තලය පැරණි වැටුප් තලය වන HMI-1 ලෙසට පරිවර්තනය කර ගැනීමට සහ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ පළමු | පුරප්පාඩුව පවතින ලේකම් තනතුර පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පිරවීමට 2021 අප්‍රේල් මස දක්වාම සභාව අපොහොසත් වී තිබුණි. | පංතියේ නිලධාරියකු ද්විතීය පදනමට අනුයුක්ත කර ගැනීම සඳහා කාර්ය පරිපාටිය සංශෝධනයට අවශ්‍ය අනුමැතිය ඉල්ලීමේ 2021 මාර්තු 15 දිනැති ලිපියට පිළිතුරු වශයෙන් දැනට තිබෙන කාර්ය පරිපාටිය අනුව බඳවා ගැනිමට කටයුතු කරන ලෙස 2021 අප්‍රේල් 08 දින ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා ඇත. ඒ අනුව බඳවා ගැනිමට ඉදිරියේදී කටයුතු කරමි. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාවගෙන් 2020 වර්ෂයේ ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 113 ක් වූවද, වර්ෂය තුළ විසඳා තිබුණ පැමිණිලි සංඛ්‍යාව 33ක් පමණක් විය. වාර්ෂිකව විසදීමට පවතින පැමිණිලි සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවෙමින් පැවතුණද, එම පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2017, 2018 සහ 2019 වසර වන විට පැමිණිලි විසඳීමේ ක්‍රමික අඩු වීමක් නිරීක්ෂණය වූවද, එම කටයුතු නියමිත පරිදි සිදුකර ඇත. පැමිණිලි හෝ විත්තිකාර පාර්ශවයන්ගේ සහභාගිත්වයේ ප්‍රමාදයන් නිසා ඒවා අවසන් කිරීමට විශාල කාලයක් ගත වේ.<br>ඉදිරියේදී පැමිණිලි විසඳාලීමේ ප්‍රගතිය වැඩිකිරිමට අවශ්‍ය සාධනීය පියවර ගැනිමට කටයුතු කරමි. | පැමිණිලි විසදීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ලේඛනයේ පවතින අයවැයගත ආදායම හා තථ්‍ය ආදායම අතර, 2020 වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තුවල රු. 508,000 ක හෙවත් සියයට 1210 කද, වෙනත් ආදායම්වල රු.1,558,385ක හෙවත් | රජයේ මිනින්දෝරුවරුන්ට වාර්ෂික බලපත්‍රය ලබා දිමේ නඩුවක් අභියාචනාධිකරණයේ විභාගවෙමින් පැවැතුණ අතර, අයවැය ලේඛනය සකස් කළ පසු ඒ සඳහා අධිකරණ තීන්දුව ලැබුණ බැවින් ඒ අනුව වාර්ෂික මැනුම් බලපත්‍රය සඳහා වූ ඉල්ලීම් නිර්දේශ කර ඉඩම් මැනුම් සභාවට ඉදිරිපත් කිරීමට සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කළ යුතුය. |

සියයට 204 කද විචලනයන් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය .

කරන ලද බැවින් සභාවේ ලියාපදිංචියද වැඩිවිය. 2020 අය වැය ලේඛනයේ පවතින ආදායම සහ තත්‍ය ආදායම වෙනස් වීමට මෙය ප්‍රධාන වශයෙන් බලපෑ අතර සීමාව ඉක්ම වූ ආදායම් විචලනයක්ද ඇති විය. ඒ අනුව මෙම වසරේ අයවැය ලේඛනය කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කිරිමට නොහැකි විය.